# සිංහලයාගේ මමත්වය

සිංහල ථෙරවාදී බුදු සසුන හෙවත් සාමාන්‍ය ව්‍යවහාරයේ කියැවෙන පරිදි බුදු සසුන ආරක්‍ෂාකිරීමට මහාවිහාරය ගත් තීරණය හේතුකොටගෙන දැනුම් නිර්මාණයෙහි දී යම් යම් ප්‍රශ්න ඇති වී තිබෙන බව පැහැදිලි ය. අළුත් දැනුම් නිර්මාණය හේතුවෙන් ථෙරවාදය නැතිවේය යන බිය සහ ඒ සමග මහායානික, තන්ත්‍රයානික අදහස්වලට හෝ වෙනත් මතිමතාන්තරවලට හෝ යටවේය යන සැකය මහාවිහාරික භික්‍ෂූන් වහන්සේට මුල දී ඇතිවන්නට ඇත. ඒ හේතුවෙන් ඉන්පසු මෙරට සම්ප්‍රදාය වී ඇත්තේ ප්‍රධාන වශයෙන් ම භාරතයේ දැනුම් යම් අවශ්‍යතා යටතේ අවශෝෂණයකිරීම බව පෙනී යයි. මුල දී එසේ කිරීමට යම් සාධාරණ හේතු තිබුණු අතර මහාවිහාරික භික්‍ෂූන් වහන්සේ මෙන් ම ගිහි උගතුන් ද තමන් කරන්නේ කුමක් ද යන්න පිළිබඳ සවිඥානික වූ බව පැහැදිලි ය. එහෙත් කල්යෑමේ දී එය හුදෙක් පැරැන්නන් අනුකරණයකිරීමක් බවට පත්වන්නට ඇත.

ඒ කෙසේ වෙතත් සිංහල ථෙරවාදී බුදු සසුන රැකීම සමග සිංහල සංස්කෘතිය ද ආරක්‍ෂාකිරීම යන සටන්පාඨය ද සිංහලයන් අතරට පිවිස ඇති බව පෙනෙයි. එය සටන්පාඨයක් ලෙස හැඳින්වෙන්නේ සිංහල සංස්කෘතියෙහි ස්වභාවය අනුව ම එසේ ආරක්‍ෂාකිරීම නොකළ හැක්කක් බැවිනි. ඉතා නිදහසක් ඇති සංස්කෘතියක් යම් තරමකින් හෝ වෙනස් නොවී, වෙනස් නොකර, තබාගත නො හැකි ය. එහෙත් එයින් කියැවෙන්නේ සිංහල සංස්කෘතිය කඹය කඩාගත් එළදෙන සිහිගන්වමින් නිදැල්ලේ වෙනස් වූ බව නො වෙයි. සිංහල සංස්කෘතියෙහි හරය විශාල ප්‍රමාණයකට වෙනස් නොවිණි යැයි කීම අතිශයෝක්තියක් නො වෙයි.

එයට හේතුව වූයේ සිංහල ථෙරවාදී බුදු සසුනෙහි බලපෑම ය. මූලික වශයෙන් අනිච්ච, දුක්ඛ, අනාත්ම (හා ශූන්‍ය) ගැන කතාකරන දහමක් මත පදනම් වූ සංස්කෘතියක පෞද්ගලිකත්වය සමාජයීය වශයෙන් ඉස්මතුවීමට ඇති ඉඩකඩ අල්ප ය. මමය මාගේ ය යන හැඟීම නැතිකරගැනීමට බැරිනම් අඩුකරගැනීමට උපදෙස් දෙන සසුනක සමාජයීය පෞද්ගලිකත්වය තුනී වී යි. එහෙත් පෞද්ගලිකත්වය මුළුමනින් ම නැතිවී ගියේ යැයි ඉන් අදහස් නො වෙයි. සමාජයීය වශයෙන් සාමූහිකත්වය ඉතා ඉහළින් අගය කෙරුණ ද, පෞද්ගලිකත්වය මුළුමනින් ම නැතිවූවා නො වෙයි. යමකු රහත් ඵලය ලැබීමට පෙර පෞද්ගලිකත්වය එසේ මුළුමනින් ම නැති විය නොහැකි නමුදු මෙහි දී අප සඳහන් කරන්නේ වෙනත් දෙයකි.

මිනිසුන් අතර මම යන්න අඩුකරගැනීමට දහමින් අනුබලය ලැබුණ ද ඇතැම්විට ඒ හේතුව නිසාම ඉන්ද්‍රිය පිනවීම ප්‍රතික්‍ෂෙප කළ ද, සාමූහිකව වැඩකළ ද මම යන්න හුවා දැක්වීමට සිංහල සංස්කෘතියෙහි අනුබලයක් ලැබෙයි. අප බොහෝ දෙනා අපේ වැඩ වෙනුවට මගේ වැඩ ගැන කතාකරන්නේ මේ තත්වය හේතුකොටගෙන ය. පන්සලකට පූජාකරන මල් අසුනක වුව ද එය අහවලාගේ පූජාවක් ලෙස සටහන්කිරීමට අපි උත්සාහ ගනිමු. එය අද පමණක් නොව පෙර ද පැවති බවට නොයෙකුත් සෙල් ලිපිවලින් තහවුරු වෙයි. එකිනෙකාගේ පූජාකිරීම් ගැන සඳහන්කරන සෙල්ලිපි රාශියකි. ඇතැම්විට සෙනෙවිවරුන්ගේ භාර්යාවන් (බිරියන්) විසින් පූජාකෙරුණු දේ ගැන ද සෙල්ලිපිවල සඳහන් වෙයි.

ආත්මය ඇතැයි කීම වැරදි යැයි කියන ථෙරවාදයට ඒ පෞද්ගලිකත්වය නැතිකිරීමට නො හැකි වූයේ ඇයි ද යන්නට අපට නිසි පිළිතුරක් නො වේ. ඒ සමහර විට ධර්මාශෝක රජුගෙන් ලැබුණු එකක් විය හැකි ය. එතුමා නොයෙකුත් සෙල්ලිපි හා ටැම්ලිපි මගින් තමන් අසවල් විහාරයට අසවල් දේ සිදු කෙළේ යැයි ජනතාවට දැනුම්දීමට පියවර ගෙන ඇත. මේ දැනුම්දීම සිංහල සමාජයෙහි සම්ප්‍රදායක් බවට පත්වී පසුකලෙක විශේෂයෙන් ම තමා විසින් කරන ලද කාර්යයන් සම්බන්ධයෙන් යම් මමත්වයක් ඇතිකිරීමට හේතු වූවා විය හැකි ය.

අලින්නෙ අපේ වැඩ කියා කියමනක් සිංහල භාෂාවේ වෙයි. ඇතැම්විට ඒ කියමනට හේතුව ද සිංහලයන් තමන්ගේ වැඩ සම්බන්ධයෙන් කතාකිරීමට, දැනුම්දීමට ඇති කැමැත්ත විය හැකි ය. අප කයිවාරුව යන්නෙන් අදහස්කරන්නේ ද මූලික වශයෙන් ගත්කල තමන්ගේ වැඩ ගැන කරන ප්‍රකාශයක් පමණක් නොව අන් අයගේ වැඩ ද තමන්ගේ වැඩ

© Prof. Nalin De Silva

ලෙස ඉදිරිපත්කිරීමකි. අද එය තමන්ගේ හා අනුන්ගේ වැඩ ගැන පමණක් නොව වෙනත් හැකියාවන්, ධනවත්කම්, දේපොළ හිමිකම් ආදිය ගැන කරන දැනුම්දීම් ද හැඳින්වීමට යොදාගැනෙයි.

එවැනි මමත්වයක් සිංහලයන් අතර අද මෙන් ම එදා ද තිබිණි යැයි කිවහැකි නමුත් මගේ දේපොළ ගැන සඳහන්කිරීමට තරම් පෞද්ගලිකත්වයක් සිංහලයන්ට තිබී නැත. අයිතිය යන්න පොදුවේ ගත්කල සිංහල සමාජයෙහි තහවුරු වූ සංකල්පයක් නො වී ය. එයට හේතුව සමාජීය වශයෙන් ගත්කල තිබූ සාමූහිකත්වයි. නිෂ්පාදන ක්‍රියාවලියෙහි දී පෞද්ගලිකත්වයට තැනක්, වැදගත්කමක් නො වී ය. මිහිඳු මහා රහතන්වහන්සේ දේවානම්පිය තිස්ස රජුට ප්‍රකාශ කෙළේ රජතුමා සියල්ලෙහි භාරකාරයා බව ය. රජයට, එනම් රජතුමාට ඉඩම් අයිතියක් නො වී ය. රාජකාරි ක්‍රමයෙහි නින්දගම්, විහාරගම් ආදියෙහි දරදඬු අයිතියක් ක්‍රියාත්නමක නො වී ය. ඉඩම් අයිතිය පිළිබඳ හැඟීමක් සිංහලයන්ට නො වී ය. එහෙත් යුරෝපයේ වැඩවසම් ක්‍රමයක පදනම ඒ බව බොහෝ දෙනාට අමතක වීමෙන් ලංකාවේ පැවතියේ ද වැඩවසම් ක්‍රමයක් යැයි කීමට ඊනියා ප්‍රබුද්ධයෝ පෙළඹී සිටිති.

අප ඉහත සඳහන් කරුණු සුළු වශයෙන් හෝ ප්‍රකාශ කෙළේ සිංහල සමාජයෙහි පැවති සදාචාරය ගැන යමක් සඳහන්කිරීමට ය. අපට අවශ්‍ය වන්නේ ඊනියා ප්‍රබුද්ධයන්ගේ වික්ටෝරියානු කුහක සදාචාරය අප රටට එළඹියේ නම් ඒ කිනම් කාලයක ද යන්නත්, යුරෝපීයයන් පැමිනීමට පෙර මෙරට සදාචාර සංග්‍රහය කුමක් වී ද යන්නත් දැනගැනීමට ය. මෙහි දී ඊනියා ප්‍රබුද්ධයන් මේ සම්බන්ධයෙන් කියන්නේ කුමක් දැයි නැවතත් මතක් කරගැනීම වැඩදායක වෙයි.

ඔවුන්ට අනුව සිංහල සමාජයෙහි දැනටත් ඇත්තේ වික්ටෝරියානු කුහක සදාචාරයකි. එය සිංහලයන්ට ලැබී ඇත්තේ බ්‍රිතානීන්ගෙන් බවට ප්‍රශ්නයක් නැත. එහෙත් ඊනියා ප්‍රබුද්ධයන් ඉන් පසුව පවසන්නේ බ්‍රිතානීන්ගේ හා සමස්තයක් වශයෙන් ගත්කල යුරෝපීයයන්ගේ පැමිණීමට පෙර ලංකාවේ පැවතියේ ඉතා නිදහස් සමාජයක් බව ය. ඔවුන් එයින් අදහස් කරන්නේ එකල ලංකාවේ විවාහය යන සංස්ථාව ඉතා ලිහිල් එකක් වූ බවත්, පිරිමින් හා ගැහැණුන් තම ජීවිත අවසන් වන තෙක් විවාහයෙන් එක්ව සිටීමට බැඳී නොසිටි බවත්, දික්කසාදය ඉතාමත් ලිහිල් එකක් වූ බවත් හා වෙනත් එවැනි දෑත් ය.

මේ සම්බන්ධයෙන් ඔවුන් රොබට් නොක්ස් පවසා ඇති ඇතැම් කරුණු ද යොදා ගන්නා බව අප කලින් කියා ඇත. ඔවුන්ට අවශ්‍ය වන්නේ විශේෂයෙන් බ්‍රිතානීන් පැමිණීමට පෙරත් සමස්තයක් ලෙස ගතහොත් යුරෝපීයයන් පැමිණීමට පෙරත් මෙරට ඉතා ලිහිල් සමාජයක් තිබූ බව කීමට ය. එයින් ඔවුන් පෙන්වීමට තැත්කරන්නේ වත්මන් සිංහලයන් තම මුතුන්මිත්තන්ගෙන් වෙන් වී බ්‍රිතානි වික්ටෝරියානු සංස්කෘතිය අනුකරණය කරන බව ය. ඊනියා ප්‍රබුද්ධයන්ට අනෙක් කරුණුවල දී කෙසේ වෙතත් සදාචාරය, විශේෂයෙන් ම විවාහය පිළිබඳ කරුණෙහි දී වත්මන් සිංහලයන් පැරැන්නන් අනුගමනය කිරීම යහපත් ය.

අපට දැන් සලකාබැලීමට ඇත්තේ එක් පැත්තකින් ඓතිහාසික සාධක අනුව පැරණි සිංහලයන් එලෙස ජීවත් වූ බව කිවහැකි ද යන්නත්, අනෙක් පැත්තෙන් සිංහල ථෙරවාද බුද්ධාගමෙන් පැරණි සිංහලයන්ට එවැනි ඉඩක් ලැබීමේ හැකියාවක් තිබිණිද යන්නත්, රොබට් නොක්ස් සඳහන්කරන දික්කසාදය එලෙස ක්‍රියාත්මක වීම පොදු කරුණක් වී ද යන්නත් ය. එමෙන් ම පැරණි සිංහල සමාජයෙහි විවාහය යන සංස්ථාවෙන් බලාපොරොත්තු වූයේ කුමක් ද යන්නත් දැනගැනීම උචිතවනු ඇත.

පැරණි සිංහලයන් අතර විවාහය යන්න සහේට ගැනීමක් බව අප කියා ඇත. සහකරුවකු හෝ සහකාරියක හෝ ලබාගැනීම ඉන් අදහස් කෙරෙයි. සහකරුවකු හෝ සහකාරියක හෝ ලබාගන්නේ වෙනත් කිසිවකට නොව ජීවිතය ගෙන යෑමටත් දූ දරුවෙන් බිහිකර සමාජය පවත්වාගෙන යෑමටත් ය. මෙහි දී සමාජය යනු සිංහල බෞද්ධ සමාජය බවත් ඒ සමාජයෙහි ප්‍රධාන අරමුණක් වූයේ සිංහල ථෙරවාද බුද්ධාගම ආරක්ෂාකිරීම බවත් මතක්කරගැනීම වැදගත් වෙයි.

© Prof. Nalin De Silva

මෙහි දී ඇතැම් ප්‍රබුද්ධයන් කියන පරිදි සිංහල රජවරුන් අන්තඃපුර පවත්වාගෙන ගියේ ද යන්න ද අපේ සැලකිල්ලට භාජනය විය යුතු ය. පැරණි භාරතයේ රජවරුන්ට අන්තඃපුර තිබූ බවත් බ්‍රාහ්මණ ආගම්වලින් හෝ පසුව හින්දු ආගමෙන් හෝ එයට දිරිගැන්වීමක් මිස බාධාවක් නොවූ බවත් සැබෑ ය. එහෙත් සිංහල ථෙරවාදී බුද්ධාගම සිඅහල රජවරුන්ට එවැනි අනුබලයක් ලබාදුන්නේ ද? මෙරට රජවරුන්ගේ අන්තඃපුර ගැන සඳහන්වන්නේ කිනම් කෘතියක ද? එසේත් නැත්නම් කිනම් සෙල්ලිපියක ද?

ඇතැම්හු මේ සඳහා කව්සිළුමිණ උදාහරණයට ගනිති. කව්සිළුමිණ කතුවරයා එහි දී විස්තර කරන හැසිරීම් මෙරට රජවරුන්ගේ ද? ඒ එසේ යැයි කිවහොත් ඒ තහවුරුකරන වෙනත් සාධක සිංහල සාහිත්‍යයෙහි තිබේ ද? කව්සිළුමිණ කාව්‍යයක් ලෙස ගතහොත් ඉතා උසස් බව නිසැක ය. කුමාරතුංග මුනිදාස පඬිතුමා ද වෙනත් පඬිවරු ද ඒ කාව්‍යය ඉතා ඉහළින් අගය කළහ. එහෙත් ඉන් එකල සමාජය පිළිබිඹු වන්නේ ද යන්න වෙනත් ප්‍රශ්නයකි. කව්සිළුමිණ රචනාකර ඇත්තේ භාරතීය මහාකාව්‍ය සම්ප්‍රදාය අනුගමනය කරමින් ය යන්න පිළිබඳ ව ඒ පිළිබඳ අදහස් දක්වා ඇති උගතුන් ප්‍රකාශකර ඇත.

එහෙත් මේ සම්බන්ධයෙන් මාර්ටින් වික්‍රමසිංහ මහතා දැරුයේ වෙනත් අදහසකි. ඒ මහතාට අනුව කව්සිළුමිණ යථාර්ථවාදී කාව්‍යයක් නො වී ය. මාර්ටින් වික්‍රමසිංහ මහතා බටහිර සාහිත්‍ය මතවාද මෙරට ප්‍රචාරයකිරීමට උත්සාහ ගත් බව අප කලින් සඳහන්කර ඇත. ඒ මහතා කව්සිළුමිණෙහි යථාර්ථවාදයක් ගැන කතාකරන්නේ ද එවැනි පසුබිමක ය. ඒ මහතා සඳහන්කරන යථාර්ථවාදය අපි පසෙකට දමමු. අපට අවශ්‍ය වන්නේ ඒ කාව්‍යයෙන් එකල සමාජය කෙතෙක් දුරට පිළිබිඹු වී ද යන්න දැනගැනීම ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva